# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,504 — 1965 සැප්තැම්බර් 11 වැනි සෙනසුරාදා — 1965.9.11**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාගයට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

### ආණ්ඩුවේ නිවේදන

**අ. ආ. කා. අංක ඔ. 364/52.**

නෙදර්ලන්තය වෙනුවෙන් සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට බලය පවරනු ලැබූ හර්මන් සෙයිබ්‍රොන්ට් හලෝ උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, මහා රාජිනීන් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර් 9 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

9–646

---

### මිල පාලන දැන්වීම්

**අංක ඇන්. ඊ. 97 දරණ ආහාර මිළ ආඥාව** | **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**මිළ පාලන පනත**

**ආඥාව**

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත්, ඉලෙකුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම මේ ආඥාවෙන්—

1. 1965 අගෝස්තු මස 19 වැනි දින අංක 14,485 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ 1965 අගෝස්තු මස 12 වැනි දින අංක ඇන්. ඊ. 94, 95 සහ 96 දරණ ආහාර මිළ ආඥාව වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

2. (173 වන අධිකාරය වන) මිළ පාලන පනත යටතේ සකස්ව කොළඹ නාගරිකයේ එවකට බලපවත්නා තොග වෙළන්දකු විසින් දළබර හොන්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ ගණනට මීට යාකර ඇති දෙවන උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් ගණන එකතු කිරීමෙන් ගැණෙන මිළ ගණන් තොග වෙළන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයකින් දළබර හොන්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ලෙස ද, ඉහත සඳහන් මිළ පාලන පනත යටතේ සකස්ව කොළඹ නාගරිකයේ එවකට බලපවත්නා සිල්ලර වෙළන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණනට මෙයට යාකර ඇති දෙවන උපලේඛනයේ හතරවන තීරයේ සඳහන් ගණන එකතු කිරීමෙන් ගැණෙන මිළ ගණන් සිල්ලර වෙළන්දකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයකුට විකිණීමේදී දෙවැනි උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ලෙසද, මේ දැන් සිට නියම කරන අතරම, මේ මිළ ගණන්වලට වැඩියෙන් දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් එම උපලේඛනයේ දෙවන තීරයේ අනු පිළිවෙලින් පෙන්වා ඇති පළමුවන උපලේඛනයේ සවිස්තරව විග්‍රහකොට ඇති සීමාවන් තුළ නො විකිණිය යුතු බව ද නියම කරමි.

3. තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා —

   (අ) දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ එම උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

   (ආ) දෙවන උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ වරකට දළබර හොන්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

4. එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නො විකිණියයුතු බවද නියම කරමි.

5. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක හෝ දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එම ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ සූචකයක හෝ පුවරුවක හෝ සටහන්කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බවද නියම කරමි.

6. එසේම, මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෙවත් "රා." යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

7. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හෝ එම උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් මිළට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි.) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම්කරුට දියයුතු බවද නියම කරමි.

8. දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, නැත හොත් බහාලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනයේ තුන්වන සහ හතරවන තීරුවල සඳහන් මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

9. මෙම නියෝගය උඩ හේවාහැට ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කොට්ඨාශයට අදාල නොවේ.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින ප.ව. 3 ට නුවරඑළිය කච්චේරියේ දී අත්සන් කරන ලදී.

අයි. ඕ. කෙ. ජී. ප්‍රනාන්දු,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන.

## පළමුවන උපලේඛනය

**අංක 1 දරණ ප්‍රදේශය :**

**ග්‍රාම සේවක කොට්ඨාශ.**—මාවෙල, මාස්වෙල, මොරපේ, කඩදොර, හපුගස්තලාව, දෝරුවාදෙනිය, හරන්ගල, නවන්ගම, කලපිටිය, හැඳුනාව, රාවනාගොඩ, විජයබාහුකන්ද, කොටගල, තලවකැලේ, ආගරපතන.

**අංක 2 දරණ ප්‍රදේශය :**

**ග්‍රාම සේවක කොට්ඨාශ.**—මැතගම, මඩකුඹුර, කඩදොරපිටිය, දුනුකේදෙනිය, කුඹල්ඔළුව, නියන්ගන්දොර, සංගිලිපාලම, රම්බොඩගම, පනන් ගම්මන, රම්බොඩ වටුම, කොටගේපිටිය, නිස්පනේ, වටද්දර, රොජසන්ගම.

**අංක 3 දරණ ප්‍රදේශය :**

**ග්‍රාම සේවක කොට්ඨාශ.**—නුවරඑළිය, කඳපොල, නානුඔය, නිල්දන්ඩාහින්න, හරස්බැද්ද, බටගොල්ල, පට්ටිපොල, ගොරඩිහෙල, කැටකඳුර, තිබ්බටුගොඩ, පන්නල, කුඹල්ගමුව

**අංක 4 දරණ ප්‍රදේශය :**

**ග්‍රාම සේවක කොට්ඨාශ.**—රාගල, රූපහ, මාලියද්ද, කුරුපනාවෙල, අඹලියද්ද.

**අංක 5 දරණ ප්‍රදේශය :**

**ග්‍රාම සේවක කොට්ඨාශ.**—අරුක්වත්ත, උඩමාදුර, කලගන්වත්ත, ගල්කැටිවල, අඹන්වැල්ල, දෙනඹුරේ, කුඹුක්වෙල, මඩුල්ල

**අංක : 6 දරණ ප්‍රදේශය :**

**ග්‍රාම සේවක කොට්ඨාශ.**—බොලගන්දාවෙල

## දෙවන උපලේඛනය

| 1 වන තීරය<br>වර්ගය | 2 වන තීරය<br>ප්‍රදේශය | 3 වන තීරය<br>තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වැඩි අධිකය |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| **ළූනු (රතුළූනු සහ චික්කබලාපූර් හැර වෙනත් සියළුම වර්ග)** ... ... ... | 1 ... | 1 90 ... | 0 02 |
| | 2 ... | 2 05 ... | 0 02 |
| | 3 ... | 2 20 ... | 0 03 |
| | 4 ... | 2 35 ... | 0 03 |
| | 5 ... | 2 45 ... | 0 04 |
| | 6 ... | 2 55 ... | 0 06 |
| **කොත්තමල්ලි** ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |

| 1 වන තීරය<br>වර්ගය | 2 වන තීරය<br>ප්‍රදේශය | 3 වන තීරය<br>තොග වෙළෙන්දකු විසින් දළබර භාණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වැඩි අධිකය |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| පියළි නොකළ උඳු ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| මුංඇට ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| තෝර පරිප්පු ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| කඩල පරිප්පු ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| සියඹලා ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| අර්තාපල් ... ... ... ... ... | 1 ... | 1 90 ... | 0 02 |
| | 2 ... | 2 05 ... | 0 02 |
| | 3 ... | 2 20 ... | 0 03 |
| | 4 ... | 2 35 ... | 0 03 |
| | 5 ... | 2 45 ... | 0 04 |
| | 6 ... | 2 55 ... | 0 06 |
| රතුළූණු ... ... ... ... ... | 1 ... | 1 90 ... | 0 02 |
| | 2 ... | 2 05 ... | 0 02 |
| | 3 ... | 2 20 ... | 0 03 |
| | 4 ... | 2 35 ... | 0 03 |
| | 5 ... | 2 45 ... | 0 04 |
| | 6 ... | 2 55 ... | 0 06 |
| සක්කරා ... ... ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| මයිසූර් පරිප්පු (පිටරට පාහින ලද 1 වැනි වර්ගය) ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |
| මයිසූර් පරිප්පු (මෙරට පාහින ලද 2 වැනි වර්ගය) ... ... ... | 1 ... | 2 90 ... | 0 02 |
| | 2 ... | 3 05 ... | 0 02 |
| | 3 ... | 3 20 ... | 0 03 |
| | 4 ... | 3 35 ... | 0 03 |
| | 5 ... | 3 45 ... | 0 04 |
| | 6 ... | 3 55 ... | 0 06 |

සැලකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියමකර ඇති මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වන අතර, ඊට ඉහළින් නො විකිණිය යුතු ය.

9–645/1

අංක ඇන්. ඊ. 98 දරණ ආහාර මිළ ආඥව | හරක් මස්, පිකුදු සහ එළු මස්

## මිළ පාලන පනත

### ආඥව

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත්, ඉලෙකුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම මේ ආඥවෙන්—

1. 1964 මැයි මස 22 වැනි දින අංක 14,041 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ 1964 මැයි මස 20 වැනි දින අංක ඇන්. ඊ. 92 දරණ ආහාර මිළ ආඥව වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

2. මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ සිට 6 වැනි තීරය දක්වා සඳහන් මිළ, හරක් මස්, පිකුදු හා එළු මස් විකිණිය හැකි වැඩිම මිළ වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් හරක් මස්, පිකුදු හා එළු මස් උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. තව ද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

   (අ) '' හරක් මස් '' යන පාඨයෙන් හරකුන් ගේ සහ මීහරකුන්ගේ මස් අදහස් කෙරෙයි. එහෙත් සියළුය වර්ගවල මාංසාවශේෂ ඉන් බැහැර කළ යුතු යි.

   (ආ) ''පිකුදු'' යනුවෙන් හැඳින්වෙන්නේ හරකෙකුගේ හෝ මීහරකෙකුගේ පිකුදු ය.

   (ඇ) ''එළු මස්'' යනුවෙන් හැඳින්වෙන්නේ බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ හෝ මස් බවත්, බොකු බඩවැල් ආදී සියළු ආකාර ඉවත් කරනු ලබන දූය රහිත ලෙසත් ය.

   (ඈ) සතෙකුගේ මළකුණ විකිණීම සඳහා මස් මඩුවේ දී පිළියෙල කොට ඇති අයුරින් එනම් : (හිස, හම, බඩවැල්, මාංසාවශේෂ, කුර, සහ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන කොටස් හැර) විකුණන විට එය '' තනි බර අනුව '' විකිණීමක් ලෙස සැලකිය යුතු යි.

4. කටු සහිත හරක් මස් හෝ එළු මස් හෝ විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25 කට වඩා කටු බර වැඩි නො විය යුතු යි.

5. මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් 1 වැනි තීරයේ ප්‍රදේශයන් තුළ කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ උපලේඛනයේ සඳහන් වර්ගවලට අයත් හරක් මස්, පිකුදු හා එළු මස් ඇති සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයේ එකී ප්‍රදේශයේ වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන සේ තැබිය යුතු බව ද නියම කරමි.

6. හරක් මස්, පිකුදු හා එළු මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශණය කළ යුත්තේ ඒ සඳහා වෙන් කොට ඇති වෙළඳ පිල්වල පමණක් වූ අතර, එම වෙළඳ පිල්වල වෙනත් වර්ගයක හෝ ශ්‍රෙණියක හෝ මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම හෝ නො කළ යුතු බව ද නියම කරමි.

7. මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශ ඇතුළත යම් ස්ථානයක ඒ උපලේඛනයේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස්, පිකුදු හා එළු මස් තම සන්තකයෙහි තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ වෙළඳ පිලෙහි එම වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස්, පිකුදු හා එළු මස් පමණක් විකුණන බවට ඒ හරක් මස්, පිකුදු හා එළු මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිළිව පෙනෙන සේ දැන්වීමක් ප්‍රදර්ශණය කළ යුතු බව ද නියම කරමි.

8. එක් ගණුදෙනුවක් කිරීමේදී හරක් මස්, පිකුදු හෝ එළු මස් සමග මාංසාවශේෂ විකුණන විට හරක් මස්, පිකුදු හෝ එළු මස් මාංසාවශේෂ වලින් වෙන් කොට විකිණිය යුතු බව ද නියම කරමි.

9. සෑම වෙළෙන්දෙකුම හරක් මස්, පිකුදු හා එළු මස් විකුණන කල්හි හරක් මස්, පිකුදු හෝ එළු මස් ලබා ගන්නාට සැබෑ බර සිතා ගැනීම පිණිස තරාදිය හෝ තරාදි පහසුවෙන් බලා ගැනීමට හැකි වන සේ තැබිය යුතු බව ද නියම කරමි.

10. මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට අයත් හරක් මස්,පිකුදු හා එළු මස් විකුණන සෑම වෙළෙන්දෙකුම හරක් මස්,පිකුදු හෝ එළු මස් ලබාගන්නා ඉල්ලා සිටිය විට, පහත සඳහන් විස්තර අඩංගු කුවිතාන්සියක් දිය යුතු බව ද නියම කරමි :—

    (අ) විකුණූ දිනය ;

    (ආ) හරක් මස්, පිකුදු හෝ එළු මස් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

    (ඇ) විකුණන ලද හරක් මස්, පිකුදු හෝ එළු මස් පිළිබඳ විස්තරය ; සහ

    (ඈ) විකුණන ලද හරක් මස්, පිකුදු හෝ එළු මස් ප්‍රමාණය සඳහා ගෙවන ලද මුදල.

11. මෙම නියෝගයෙන් උපරිම මිළ නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළම කිසිවකු විසින් උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය වෙනත් කිසිම මසක් හෝ මාංසයක් සමග මිශ්‍ර කොට නොවිකිණිය යුතු බව ද නියම කරමි.

12. උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය විකුණන විට එකී ද්‍රව්‍ය ඔතා හෝ බහාදෙන හෝ ද්‍රව්‍යයක මිළක් වේනතෙත් එය එම උපලේඛනයේ 2 සිට 6 දක්වා වූ තීරුවල සඳහන් වැඩි ම මිළ ගණනට ඇතුළත් වන බවද නියම කරමි.

13. මෙම නියෝගයෙහි කාර්යය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යනුවෙන් අදහස් කරන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින ප. ව. 3 ට, නුවරඑළිය කච්චේරියේදී අත්සන් කරන් ලදී.

අයි. ඕ. කෙ. ජී. ප්‍රනාන්දු,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය (කටු රහිත හරක් මස්) රාත්තලක උපරිම මිළ | 3 වැනි තීරය (කටු සහිත හරක් මස්) රාත්තලක උපරිම මිළ | 4 වැනි තීරය පිකුදු රාත්තලක උපරිම මිළ | 5 වැනි තීරය (කටු රහිත එළු මස්) රාත්තලක උපරිම මිළ | 6 වැනි තීරය (කටු සහිත එළු මස්) රාත්තලක උපරිම මිළ |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| නුවරඑළිය මහ නගර සභා සීමා ප්‍රදේශය | 0 95 | 0 75 | 1 10 | 2 70 | 2 50 |
| කඩවත් සතර ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය | 0 95 | 0 75 | 1 10 | 2 70 | 2 50 |
| උඩපලාත ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 80 | 1 25 | 2 75 | 2 50 |
| දිඹුල ගම් කාර්ය සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 80 | 1 25 | 2 75 | 2 50 |
| තලවකැලේ–ලිඳුල පළාත් ආණ්ඩු සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 80 | 1 25 | 2 75 | 2 50 |
| උලපනේ ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 75 | 1 25 | 2 75 | 2 50 |
| තිස්පනේ ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 80 | 1 25 | 2 75 | 2 50 |
| පල්ලේපනේ ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 80 | 1 25 | 2 75 | 2 50 |
| පූන්ඩළුඔය සුළු නගර සභා සීමා ප්‍රදේශය | 1 0 | 0 80 | 1 25 | 2 75 | 2 50 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වන අතර, ඊට ඉහළින් නො විකිණිය යුතු ය.

9–645/2

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/198

ආදයම් රක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1965 සැප්තැම්බර් මස 13 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඔනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 04 |
| ඔනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 06 |

අංක ඒ. 781.
1965 සැප්තැම්බර් මස 11 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දිය.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9–671

---

## රේගු දැන්වීම අංක 64/5/58

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 සැප්තැම්බර් මස 13 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 204 9/20 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 264 45 ... | 242 86 ... | 206 24 ... | 66 11 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඒ. 744/22.
1965 සැප්තැම්බර් මස 11 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දිය.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9–672

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි